දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
**Devi Balika Vidyalaya - Colombo**

පළමු වාර පරීක්ෂණය - 2012
**First Term Test - 2012**

බුද්ධ ධර්මය

7 ශ්‍රේණිය

පැය එකයි

* පහත සඳහන් සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) බුද්ධ ශාසනයේ සඳහන් වන ප්‍රථම ආරාම පූජාව කවරක්ද ?
1. ජේතවනාරාමය
2. වේළුවනාරාමය
3. මාලුකාරාමය
4. අශෝකාරාමය

02) බුදුරජාණන් වහන්සේ තමන්ගේ ප්‍රථම ධර්ම දේශනාව කරනු ලැබුවේ
1. තපස්සු භල්ලුක දෙපලට
2. පස්වග තවුසන්ට
3. භද්දවග්ගිය කුමරුට
4. උපකනම් ආජීවකයාට

03) තුන්බිය දුරිකිරීම සඳහා බුදුරජුන් විසින් දේශනා කරනු ලැබුවේ
1. රතන සූත්‍රය
2. සිගාලෝවාද සූත්‍රය
3. කරණීය මෙත්ත සූත්‍රය
4. ධම්මචක්කප්පවත්වන සූත්‍රය

04) බුදුරජුනේගේ දෙවන ධර්ම දූත පිරිස වූයේ
1. නදී කාශ්‍යප ගයා කාශ්‍යපයන්ය
2. භද්ද වග්ගිය කුමරුන් තිස්දෙනාය
3. පස්වග තවුසන්ය
4. සංජය පරිබ්‍රාජකයා ඇතුළු පිරිසය

05) සුදෙවුන් රජතුමාට බුදුරජානන් වහන්සේ විසින් දේශනා කරනු ලැබුවේ
1. සාම ජතාකය
2. දහම්සොඬ ජාතකය
3. මහා ධර්මපාල ජාතකය
4. ගිරිකුල ජාතකය

06) දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීමේදී සෝවාන් ඵලයට පත්වූ තාපසතුමා කවරෙක්ද ?
1. මහානාම
2. කොණ්ඩඤ්ඤ
3. අස්සජි
4. වප්ප

07) සතුරාහට මෛත්‍රී කිරීම තුලින් ලැබිය හැකි අනුසස් අතරින් පරලොවට අදාල වන ආනිසන්ස වන්නේ,
1. අමනුෂ්‍යාට ප්‍රිය වීම
2. සුවසේ අවදිවීම
3. සිහිමුලාවකින් තොරව මිය යාම
4. මෙහවයේ රහත් වීමට නොහැකි වුවත් බ්‍රහ්ම ලෝකයේ උපත ලැබීම

08) බුදු රජුන් විසින් මුගලන් මහරහතන් වහන්සේට දේශනා කල සූත්‍රය වන්නේ
1. මහා බොජ්ඣංග සූත්‍රය
2. මහා මංගල සූත්‍රය
3. රතන සූත්‍රය
4. කරනීය මෙත්ත සූත්‍රය

09) කරණීය මෙත්ත සූත්‍රයෙහි සල්ල හුකවත්ති යනුවෙන් හැඳින්වෙන්නේ කවරක්ද ?

1. නුවණ ඇති බව
2. තැන්පත් ගති පැවතුම් ඇතිබව
3. වරදක් නොකරන බව
4. සැහැල්ලු ගති පැවතුම් ඇති බව

10) කරණීය මෙත්ත සූත්‍රය බුදු පියාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබුවේ කුමන ස්ථානයකදීද ?

1. රජගහ නුවර
2. වේළුවනාරාමය
3. දෙව්රම් වෙහෙර
4. කිඹුල්වත් නුවර

(02) හිස්තැන් පුරවන්න.

බුදුරජානන් වහන්සේ හුදකලාව 11) ........................................ බලා වැඩම වන එසේ වඩිනා උන්වහන්සේට බෝ මැඩටත් ගයාවටත් අතරදී 12) ........................................ නම් 13) ........................................ මුණ ගැසිණි. හෙතෙම බුදුරජාණන් වහන්සේගේ ශාන්ත වූ කරුණාබර වූ බැල්මෙන් යුත් එහෙත් 14) ........................................ දැක පැහැද 15) ........................................ තොරතුරු විචාළේය.

(03) යා කරන්න.

| | | |
|---|---|---|
| 16) | බිම්බිසාර රජතුමා එතුමාගේ මහනර උද්‍යානය නම් කරනු ලැබුවේ | ගුණයට ගරු කිරීම |
| 17) | දෙවනුව පස්වග තවුසන් සිහිකිරීම | රතන සූත්‍රය |
| 18) | විශාලා මහ නුවර තුන්බිය දුරුකලේ | කලන්දක නිවාපයෙනි |
| 19) | අදින්න පුබ්බක ලෝභ සිටුවරයාගේ සිත් | මට්ටකුණ්ඩලී |
| 20) | මුගලන් මහ තෙරුවන්ට පිරිත් දේශනා කලේ | සික්කාපදන් සමාදියාමි |

* ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(04) සෙත්සිරි දෙන මහ ගුණ මුහුදානම් කවිය කුමන ග්‍රන්ථයට අයත් කවියක්ද එම කවිය සම්පූර්ණ කර ඔබට ගැයෙන සේ මෙම කවිය පහදන්න.

(05) 1. සතුරාගෙන් පලිගැනීම වෙනුවට සතුරාට මෛත්‍රී කිරීමට තුලින් මිනිසාට ලැබිය හැකි අනුසස් 5 ක් දක්වන්න.

2. එම අනුසස් අප ජීවිතයට ප්‍රයෝජනවත් විය හැකි අන්දම විදහා දක්වන්න.

(06) 1. මෙත් වඩන්නාගෙන් ගුණ සනිටුහන් වන්නේ කුමණ සූත්‍රය තුලින්ද ?

2. පුද්ගලයකුට තමාගේ අභිමතාර්ථයන් ඉටුකර ගත හැකි ගුණාංග 5 ක් නම් කර ඒවා පැහැදිලි කරන්න.

(07) 1. බුද්ධාදී උත්තමයෝ මෛත්‍රීකරන පුද්ගලයා හැදින්වූයේ කෙසේද ?

2. මෙත්වඩන පුද්ගලයා මේ ආත්මයේදී නිවන් දැකීමට නොහැකි වුවහොත් ඒකාන්තයෙන්ම සිදුවන්නේ යැයි විශ්වාස කරන්නේ කුමක්ද ?

(08) 1. බුදුරජානන් වහන්සේගේ අසරණ සරණ ගුණය පැහැදිලි කිරීමට නිදසුන් පහක් ලියන්න.

2. එතුමන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කල අවස්ථා දෙකක් පැහැදිලි කරන්න.

(09) 1. ප්‍රථම ධර්මදූත පිරිස අමතා බුදුරජුන් වහන්සේ දේශනා කල ප්‍රකාශ තුළින් ප්‍රධාන වශයෙන් පිලිබිඹුවන්නේ කවරක්ද ?

2. තුම්බෑ ජටිලයන්ගේ වැරදි වැටහීම (තමන් උගත් යැයි සිතු) නැතිකිරීම සඳහා බුදුරජානන් වහන්සේ ගත් පියවර කවරක්ද පැහැදිලි කරන්න.